කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
# University of Kelaniya - Sri Lanka

විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය
## Centre for Open and Distance Learning

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය
(බාහිර) - 2008

**Bachelor of Arts (General) Degree Second Examination (External) – 2008**

මානවශාස්ත්‍ර පීඨය
**Faculty of Humanities**

වාග්විද්‍යාව - LING –E2015
**Linguistics - LING –E2015**

පදිම විචාරය හා වාක්‍ය විචාරය
Morphology and Syntax

එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
Answer five (05) questions only selecting at least two questions from each section.

ප්‍රශ්න සංඛ්‍යාව: 08 යි. | කාලය: පැය 03යි.
No. of questions: 08. | Time: 03 hours.

---

## 1 කොටස - පදිම විචාරය
## Part I - Morphology

1. කිසියම් භාෂාවක වචන හඳුනා ගැනීම සඳහා භාවිත කළ හැකි නිර්ණායක නිදසුන් සහිතව පැහැදිලි කරන්න.
Explain the criteria that can be used to identify words in a given language, with suitable examples.

2. අ. අදාළ භාෂාව පිළිබඳව ඔබ සතු දැනුම ප්‍රයෝජනයට ගනිමින් පහත දැක්වෙන දත්ත සංහිතාවක (a හෝ b) පැනෙන පදිම වෙන් කරන්න.

Segment the morphemes seen in the data set (either a or b) given below, using your linguistic knowledge in the relevant language.

ආ. එම පදිම වර්ග කරන්න.
Classify those morphemes.

a. මනුෂ්‍ය සමාජයේ ක්‍රමවත් පැවැත්ම සඳහා එහි කටයුතු මනා සේ සංවිධානය වී තිබීම අවශ්‍යය. විධිමත් සංවිධානයකින් තොරව ක්‍රමානුකූල සමාජ ජීවිතයක් පැවතිය නොහැකිය. මෙය විශේෂයෙන් පැහැදිලි වන්නේ භෞතික කරුණු අතින් සංවර්ධනයට පත් සමාජයන් සම්බන්ධයෙනි.

b. The subdiscipline of linguistics that deals with such patterns is called morphology. The existence of such patterns also implies that word may have an internal constituent structure. walking can be divided into the constituents. Therefore, morphology deals with the internal constituent structure of words as well.

3. "යෙදෙන පරිසරය අනුව පදිමයක් වෙනත් රූපවලින් ඉදිරිපත් විය හැකිය." මේ කියමන ප්‍රමාණවත් නිදසුන් මගින් පැහැදිලි කරන්න.
"Depending on the context morphemes appear in different forms." Explain this statement with substantial examples.

4. ඔබ කැමැති භාෂාවක පද සාධන විධි නිදසුන් සහිතව විස්කර කරන්න.
Describe different types of word formation in a language of your choice.

## ii කොටස - වාක්‍ය විචාරය
## Part ii – Syntax

5. අ. වාක්‍යය යනු හඳුනා ගැනීමට විවිධ වාග්විද්‍යාඥයන් ඉදිරිපත් කර ඇති නිර්වචන ලියා දක්වන්න.
Write definitions of 'sentence' given by various linguists.

ආ. ඒවා අතුරින් දෙකක් (02) නිදසුන් මගින් පැහැදිලි කරන්න.
Explain two of them with examples.

6. අ. ව්‍යාකරණ ප්‍රවර්ග යනු මොනවාදැයි නම් කරන්න.
Name Syntactic categories.

ආ. ඔබ කැමති භාෂාවක ඒ ඒ ව්‍යාකරණ ප්‍රවර්ග හඳුනා ගැනීම සඳහා භාවිත කළ හැකි නිර්ණායක පැහැදිලි කරන්න.
Explain the criteria that can be applied to identify each of these categories in a language of your choice.

7. පහත සඳහන් මාතෘකා අතුරින් තුනක් (03) පිළිබඳ කෙටියෙන් සාකච්ඡා කරන්න.
Discuss briefly three (03) of the following topics.
i. ශක්‍යතාව - Competence
ii. ව්‍යාකරණාත්මක බව -Grammaticality
iii. අනන්තර සංයෝජක විශ්ලේෂණ විධි ක්‍රමය -Immediate constituent analysis (IC analysis)
iv. ව්‍යාකරණ පන්ති – Grammtical classes
v. ව්‍යාකරණ සම්බන්ධතා – Grammatical relations
vi. ජනක ප්‍රතියෝජන ව්‍යාකරණය – Transformational generative grammar

8. පහත සඳහන් වාක්‍ය අතුරින් තුනක් (03) පිළිබඳ වාක්‍ය විචාරාත්මක විග්‍රහයක් ඉදිරිපත් කරන්න. ඒ ඇසුරින් ප්‍රස්තුත භාෂාවට අදාළව වාක්‍ය විචාරාත්මක නීති ඉදිරිපත් කරන්න.
Make a syntactic analysis on three (03) of the following sentences and give syntactic rules for the relevant language.
i. සුනිල් හිතනවා එයාට රස්සාව හම්බවෙයි කියලා.
ii. ලංකාවෙ මිනිස්සු වැඩිපුර කන්නෙ බත්.
iii. නයෙකුයි පොළඟෙකුයි සටන් කරනවා අපි දැක්කා.
iv. Sunil thinks that he will get the job.
v. An attractive salary will be offered to the selected candidates.
vi. The academy seeks a young dynamic individual to assist the financial services industry.